# ශාකයයි සංස්කෘතියයි

## අඹ



පවන් සලමින් සාන්තිය පතා මැතිරීමට ඇදුරෝ යුහුසුලු වෙති. අඹ ගසත්, පත්තිනි දේවියත් අතර ඇත්තේ බලවත් සබඳතාවකි. ඇය වරක් අඹ ගෙඩියකින් පහළ වූ බව විශ්වාස කෙරේ.

අඹ අප රටේ මුල්තැන ගන්නා ජනප්‍රිය පලතුරකි. මී අඹ, ඇටඹ, කොහු අඹ, රට අඹ, හිනි අඹ ආදී වශයෙන් අඹ වර්ග රැසකි. මී අඹ, ඇටඹ දෙක වනගතව වැවේ. කර්ත කොලොම්බම් වැනි අළුත් අඹ වර්ග වැවීමට මිනිස්සු පුරුදුව සිටිති. අඹ ගසක් නොවැවුණු ඉඩමක් ලංකාවේ නැත. නව නිවසක් ගොඩ නැගුවිට ගෙවත්තේ දෙමුහුන් අඹ ගසක් සිටුවීමට කවුරුත් කැමතිය.

අඹ මල්ල, අඹතලේ, අම්හස්තලය, අම්පෙ, අම්පාගල, මී අඹකන්ද, අඹගමුව, අඹේවෙල, පොල් අඹේගොඩ, අඹේපිටිය, අඹතැන්න,

පඩි රජුත් දෙවිවරුත් අතර සටනක් ඇතිවෙයි. යුද්ධයෙන් ජය ලැබීමට දෙවිය-න් අපොහොසත්ය. පඩි රජුගේ තෙවැනි ඇස වනසා දමන ලෙස සක් දෙවියෝ පත්තිනියට කියති. ඇය පඩි රජුගේ උයනේ අඹ ගසක අඹයක්ව උපදී. ඇයගේ පිරිවර දහසද එම ගසේ අඹ පල හැටියට උපත ලබති. පත්තිනි අඹයෙන් ගිනි පුළිඟු විසිරෙන අයුරු දක්නට ලැබේ. රජු මේ ගැන උගත් ඇමතියන් ගෙන් විමසයි. පිළිගත හැකි විසඳුමක් නැත. ඊ පහරින්, පොලු පහරින් අඹය නටුවෙන් වෙන් නොවේ. රජු අඹ ගස කපා හෙලන්නට

# "අඹේ පළමු උපතකි පෙර සත් පත්තිනි නම ලැබුවේ"

අඹන්වෙල ආදී ගම් රැසක් අඹ නිසා ප්‍රකට වු ඒවා බව පෙනේ.

"අමං බාලං කෂායම්ලං - රුච්‍යය මාරුත පිත්තදං
අත්‍යම්ලං තරුණං තන්තු - ත්‍රිදොෂාසු ප්‍රකෝපනම්"
"සාරාර්ථ සංග්‍රහය"

අයුර්වේද සංකල්ප අනුව අමු අඹ තුන්දොස් ප්‍රකෝප කරයි. කසට හා අම්ල රස වලින් යුක්තයි. ඉදුණු අඹ වල ගුණ මෙසේ සඳහන්ව ඇත.

"පක්වන්තු අම්ලං මධුරං
- සනිග්ධං වෘෂ්‍යං බලාවහම්
ශිතං වාත හාරං හෘද්‍යං
- ගුරුවර්ණාම පිත්තලං"

වාය බැහැර කරන, හෘදයට හිතකර මධුර රස ඇති පලතුරකි ඉදුණු අඹ. ආයුර්වේද වෛද්‍යකර්ම වලදී අඹපොතු, අඹ ඇට මද ආදියද යොදා ගැනේ.

බෞද්ධ සංස්කෘතිය මෙහි ගෙනැ ආ මිහිඳු හිමිය-න් එදා මිහින්තලාවේදී දෙවන පියතිස්ස රජුගේ බුද්ධි මහිමය මැන බැලුවේ එතැන වු අඹ ගසක් මුල්කර ගෙන ප්‍රශ්න නැගීමෙනි.

"මේ ගස කිමෙක්ද මහරජ"
"අඹ ගසකි ස්වාමීනි"
"මේ අඹ ගස හැර තවත් අඹ ගස් තිබේද ?"
"ඇත ස්වාමීනි"
"මේ අඹ ගසත් වෙනත් අඹ ගසුත් හැර තවත් ගස් තිබේද ?"
"ස්වාමීනි ! අඹ නොවන තවද ගස් බොහෝ ඇත"
"ඒ අඹ ගසුත් නොඅඹ ගසුත් හැර තවත් ගස් තිබේද ?"
"එසේය, මේ අඹ ගස ඇත, ස්වාමීනි"

කිසිම හැල හැපිල්ලක් නැතිව එදා අඹතලා කඳු මුදුනේදී රජතුමා දුන් පිළිතුරෙන් රජුගේ බුද්ධි මහිමය පිළිගත් මිහිඳු හිමියන් රජු ගැඹුරු බුදු දහම තේරුම් ගැනීමට සුදුස්සකු බවට තීරණය කළ බව ඉතිහාසගතය. දෙවන පියතිස්ස රජුගේ මලනුවන් වු මහානාම යුවරජුට රජකම හිමිවීමට ඉඩ නොදී ස්වකීය පුත්‍රයාට එය හිමි කරනු වස් යුවරජු මැරීමේ අරමුනෙන් වැවක් කරවමින් සිටි ස්ථානයට රජබිසව විසින් විෂ අඹ සහිත බඳුනක් යැවූ බවත් එම විෂ අඹ කා රජ කුමරු මියගිය බවත් මහානාම යුවරජු මරණින් ගැලවී රෝහණයට පලාගිය බවත් මහාවංශයේ සඳහන් වේ. එබැවින් රෝහණ රජ පෙළපතේ ආරම්භයද අඹ නිසා සිදුවිය.

උත්සව අවස්ථා වලදී ගෙය ඉදිරිපිට අඹ අතු එල්වීම හින්දු චාරිත්‍රයකි. අඹ කොල අත්තෙන් අණදෙයි. එයද දුෂ්කරය. ගසින් පුලිඟු විසිවෙයි. සක් රජු මහළු වෙසක් ගෙන අඹය විදීමට එයි. මිනිස්සු ඔහු උපහාසයට ලක් කරති. හේ අඹයට විදියි. නටුවෙන් ගිලිහුණු අඹය බිමට වැටෙන්නට නොදී අල්ලා ගනු ලැබේ. අඹ නටුවෙන් විසිරී ගිය කිරි පඩි රජුගේ තෙවැනි ඇසට වැටී එය අන්ධ වෙයි. රනින් යානාවක් තනා අඹය ඒ මත තබා ගඟේ පාකර හැරේ. දිය නාමින් සිටි මානායුරු රජුගේ බිසව මෙය දකී. යාත්‍රාව තබා සතු බව රජු පවසයි. එහි ඇතිදේ තමාට බව දේවිය කියයි. රජු හා බිසව අඹය කරඬුවක තබා රකී. යළි සක් රජු වෙස් වළා පැමිණ තම අඹුව වෙනුවෙන් අඹයක් සොයා ඇවිදින බව පවසයි. රජු හා බිසව රන් අඹය ගැන විමසා බලයි. කරඬුව තුල රන්වන් කුමරියක් වෙයි. මේ කුමරිය වැඩී, තරුණ වියට පත්ව පාලඟ කුමරු හා විවාහ වෙයි.

කොහොඹ කංකාරියේදීත් (ගම්කාරිය), ගම්මඩු වැනි දේවකාරි වලදීත් "අඹ විදමන" නමින් රංගනයක් ඉදිරිපත් කෙරෙන්නේ මේ සිද්ධිය සිහිපත් කරවමිනි.

අපේ සාහිත්‍ය තුළටද අඹ නොයෙක් අන්දමින් ඇතුළත් වෙයි. අඹ රස උරා බොන ගිරවුන් ගැන ගිරා සන්දේශයේ මෙසේ වර්ණනා වෙයි.

"ඉඳුනිල් කොලතුරා - රැඳි මියුරායා
විලිකුන් අඹ ඉරා - තුඩග තබායා
එන රස උර උරා - ලොබ නොහැරායා
නරඹ නදන ගිරා - කැල ඉඳුරායා"

පසේ බුදුවරයෙකුට මී අඹ පිදු ලේනකු ගැන කිය-වෙන ජාතක කථාවක් ජාතක පොතට ඇතුළත්ව ඇත. අප බුදුන් වහන්සේට මී අඹ පිදු උයන් ගොව්වකු පිළිබඳ කථාවක් පුජාවලියේ 23 වන පරිච්ඡේදයේ එයි.

ඉක්බිත්තෙන් ඇසළ මැදි පොහෝ දිනයෙහි ස්වාමි දරුවෝ උයද කළ මනා සියළු බුද්ධ කෘත්‍යය නිමවා පාත්‍ර සිවුරු දරා මහ සඟ පිරිස් පිරිවරා සිඟා වඩනා සේක්. නුවර වාසල් දොරට පැමිණි සේක. එකල රජ්ජුරුවන්ගේ ගණ්ඩ නම් උයන් ගොවුවා උයන බලා ඇවිදිනේ දිම් කසල්ලෙක සැඟවී මුහුකුරා විලික්සව තිබු කොමඩු පුසුලක් සා ඇති මී අඹ පතක් දැක කඩාගෙන මේ අකාල එලය රජ හට දෙමියි සතුටුව රජගෙට යනුයේ සිඟා වඩිනා බුදුන් දැක උපන් පස් වනක් ප්‍රීතින් පිනා මේ අඹ පක රජ්ජුරු-වන්ට දිනිම් නම් රජ්ජුරුවෝ ඉතා සන්තෝෂ වු නම් මට අට මස්සක් හෝ දෙති. සොළොස් මස්සක් හෝ දෙති. තවත් පැහැදී ගියෝ නම් ජාතියෙහි රැකෙන පමණක් සැපත් දෙති. බුදුන්ට පිළිගැන්වීම් නම් ජාති සහශ්‍රයෙක මට මහත් වු සම්පත් ලැබෙයි. සසරින් ගැලවීමට කාරණ වෙයි. අද මේ බුදුන්ටම පිළිගන්වමියි සිතා මී අඹ පස දැක දෑතින් ගෙන නැඹුරු නැඹුරුව බුදුන් සමීපයට ගොස් ස්වාමීනි ! මේ අඹ පක පිළිගෙන ගැත්තහුට අනුග්‍රහ කොට වදාළ මැනවැයි කියා බුදුන්ගේ ශ්‍රී හස්තයට පිළිගැන්වීය.

යම් පුද්ගලයකුගේ ලය මෘදු නම් එය ලා අඹ දල්ලකට උපමා කිරීම සාහිත්‍යකරවන්ගේ සිරිතය. "අඹ විචාලවුන්ට දෙල් කියන්නා සේ" වැනි උපමා සද්ධර්ම රත්නාවලිය වැනි ග්‍රන්ථ වල ට ඇතුලත්ව ඇත. අඹ දලු කමින් සිටි පර පුටුවන් ගැන ගිරා සඳෙස මෙසේ කියයි.

"අඹ දලු පල රඹා සිඳ නොතබා ය
ගෙන තම පිය අඹා තුඩග තබායා
සිඹ සිඹ රති ලොබා දෙපිය ගබායා
උන් පරපුටු සුබා සකි නරඹායා"

පොදු ජනතාව ගේ ගැමි කවියට ද අඹ අමතකවී නැත. ඇටඹ ගසක නැගි මස්සිනා තම නෑනා කැඳවා ගන්නට යවන පණිවිඩුයකි, මේ.

"ඇටඹ ගසේ මා ඉදිතෙයි කියාපන්
ඇටඹ කකා ලෙලි දමතෙයි කියාපන්
මිනි මිනි පොදේ මා තෙමෙතෙයි
කියාපන්
ඇටඹ ගෙනියන්ට මල්ලක් එවාපන්"

සිංහල ජන ජිවිතයත් අඹයත් අතර ඇති සංස්කෘතික බැඳීම විශාලය.



ශාස්ත්‍රවේදී
නා. ලි. සාර්ලිස් අමරසිරි

විශ්‍රාම ලත් විදුහල්පති,
ශාස්ත්‍රවේදී
නා.ලි. සාර්ලිස් අමරසිරි

